| 01. | **අධ්‍යාපන සුදුසුකම් :** | | |
| | i. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය; | 08 | |
| | ii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය; | 07 | |
| | iii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය; | 06 | |
| | iv. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය; | 06 | 20 |
| | v. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය; | 05 | |
| | vi. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB); | 04 | |
| | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලය මඟින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්; | 03 | |
| | viii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්; | 02 | |
| | ix. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය. | 03 | |
| | **රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් යනු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් වේ.** | | |
| | (ඉහත සඳහන් සියළුම කුසලතාවයන් උපරිම ලකුණු 20 කට සීමා වේ.) | | |
| | *ඉහත අධ්‍යාපන සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය. | | |

| *අනු අංකය* | *ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | වෘත්තීය පළපුරුද්ද :<br>i. ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීම. (එක් අවුරුද්දක් සඳහා ලකුණු 02 බැගින්);<br>ii. රජයේ හෝ පිළිගත් නීති ආයතනයක ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීමෙන් දක්වන ලද කුසලතා.<br>(ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය.)<br><br>**සටහන**:-විනිශ්චයකාරවරයෙකුගෙන් වෘත්තීය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. **නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ.** | 10<br><br>10 | 20 |
| 03. | **විශේෂ දක්ෂතා** :<br>i. සන්නිවේදන කුසලතාවය<br>ii. හිටිවන කථිකත්වයේ කුසලතාවය<br>iii. සභාව ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය<br>iv. භාෂාව හැසිරවීමේ හැකියාව | 05<br>05<br>05<br>05 | 20 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා :<br>i. පෞරුෂත්වය<br>ii. ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව<br>iii. නායකත්ව ගුණාංග<br>iv. නීතිය හා අධිකරණ කටයුතු පිළිබඳව ඇති දැනුම | 05<br>15<br>05<br>15 | 40 |
| | එකතුව | | 100 |

II. අවසාන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| I. තර්ක ශක්තිය<br>II. කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව<br>III. ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව<br>IV. මූලික නෛතික සිද්ධාන්ත දැනුම | 25<br>25<br>25<br>25 |
| එකතුව | 100 |

10. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය** :

**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.**

සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**සැලකිය යුතුය :**

අ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 9-I හි අනු අංක 01 හා 02 යටතේ පිළිවෙළින් දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතික පත් හා ලියවිලිවල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

ආ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික හා ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

නීතිපති.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
උපරිමාධිකරණ සංකීර්ණය,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

05-127

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

### සෞඛ්‍ය අමාත්‍යාංශය

''සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණය (MN-03-2006ඒ) විකලාංග වැඩපල කාර්මික ශිල්පී තනතුර (විවෘත) සඳහා බඳවා ගැනීම - 2024''

2024 මාර්තු මස 07 දිනැති අංක 2375 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024.05.18** දින දක්වා දීර්ඝ කරනු ලබන අතර ඉහත කී *ගැසට්* නිවේදනයේ සියලු කරුණු එලෙසම බල පැවැත්වේ.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

05-119

සංශෝධනයයි

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

''සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (MN03-2006-ඒ) දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024''

2024 මාර්තු මස 01 දිනැති අංක 2,374 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024.06.02** දින දක්වා දීර්ඝ කරනු ලබන අතර ඉහත කී *ගැසට්* නිවේදනයේ සඳහන් සියලු කරුණු එලෙසම බලපැවැත් වේ.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

05-120

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල වලට සිසුන් ඇතුලත් කර ගැනීමේ විවෘත තරග විභාගය -2024

Open competitive Examination for the enrollment of students for the Higher National Diploma in Agricultural Production Technology in Sri Lanka Schools of Agriculture -2024

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල යන්හී පැවැත්වෙන"කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 6)" හැදෑරීම සඳහා 2025/2027 අධ්‍යයන වර්ෂයට අදාලව සිසුන් ඇතුලත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් 2024 සැප්තැම්බර් මාසය තුලදී සිංහල හා දෙමළ මාධ්‍යයවලින් ප්‍රධාන නගර කීපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වීමට අපේක්ෂිතය.

02. **කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටම (NVQ level 6) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අඟුණකොළ පැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වව්නියාව යන කෘෂිකර්ම විද්‍යාලයන් තුල කාන්තා සහ පිරිමි දෙපාර්ශවයට ම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 2 1/2කි. එයින් වසර 2 ක් කෘෂිකර්ම විද්‍යාලයක් තුලදී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබාගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුලත් කර ගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම්වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුලින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත්කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

03. පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :

3.1 *අධ්‍යාපන සුදුසුකම්* :

අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබිය යුතු අතර සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයන් තුන සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයන් තිබිය යුතුය;

ඉහත වාර දෙක තළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී හෝ ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ( S) ලබා තිබිය යුතු වේ;

සහ

අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් එකවර ලබා තිබීම;

හෝ

අ.පො.ස.(උ.පෙ.) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණවේදය/ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම;

**වැදගත්** : ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ විෂයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.

3.2 2024.06.10 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 1999.06.10 දින හෝ ඊට පසු හා 2006.06.10 දින හෝ ඊට පෙර විය යුතුය)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල්වන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරා ගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යය වලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිතව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල 2024 සැප්තැම්බර් මාසය තුළදී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදාළ අංකය නියමිත ස්ථානයේ ඇතුළත් කළ යුතුය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | අම්පාර |
| 2. | අනුරාධපුරය |
| 3. | දඹුල්ල |
| 4. | ගම්පහ |
| 5. | ගාල්ල |
| 6. | හම්බන්තොට |
| 7. | මහනුවර |
| 8. | කුරුණෑගල |
| 9. | වව්නියාව |

4.3 විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති විට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

05 *අයදුම්පත් කැඳවීම* :

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කල යුතුය.

5.2 අයදුම්කරු අ.පො.ස (සා.පෙ) විභාගයට පළමුවරට පෙනී සිටි දිස්ත්‍රික්කය ඔහු/ඇය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකන බැවින්, අයදුම්පත පිරවීමේ දී තමා අ.පො.ස (සා.පෙ.) විභාගය සඳහා පළමුවරට පෙනී සිටි දිස්ත්‍රික්කය ඊට අදාළ ස්ථානයේ සඳහන් කළ යුතුය.

5.3 විභාග ගාස්තුව රු.1,300.00කි. මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කල දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ සඳහන් කළ යුතුය.

5.4 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතු වේ. අයදුම්පත සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් 0812388340 හෝ 0812388341 යන දුරකතන අංකවලින් විමසීමක් සිදු කල හැකිය.

5.5 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

5.6 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2024.06.10** දිනෙන් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.7 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කල අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීම අනිවාර්ය වේ.

5.8 එසේ ලබාගත් මුද්‍රිත පිටපත පහත සඳහන් සියලු ඇමුණුම් සහිතව නොගැලවෙන පරිදි අමුණා ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2024.06.18** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 6)" යන්න සඳහන් කළ යුතුය.

*ඇමුණුම්* :

i. අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්,
ii. අ.පො.ස. (උ.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත,
iii. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත,
iv. උප්පැන්න සහතිකයේ ඡායා පිටපත,
v. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.9 5.8 හී සඳහන් සියලු ඇමුණුම් සහිත අයදුම්පතෙහි මුද්‍රිත පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත්තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. *අනන්‍යතාවය සනාථ කිරීම* :

6.1 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත් කල යුතුවේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය.

07. විභාග ක්‍රමය :

7.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහාම ලකුණු 100 බැගින් ලබා දී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු වල සාමාන්‍ය ලෙස ප්‍රකාශයට පත් කෙරේ.

7.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

7.3 විෂය නිර්දේශය :

***කෘෂිකර්මය*** : අ.පො.ස. (උ.පෙ) කෘෂිකර්ම විෂය නිර්දේශය මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත් කාලීන විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

***බුද්ධි පරීක්ෂණය*** : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වේ.ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු වේ.

7.4 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඇමුණුම් ද සහිත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මගින්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම්දෙනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු ද සමගින් 0812 388 085 හෝ 0812 388 059 යන දුරකතන අංකවලින් විමසීමක් කළ හැකිය.

7.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ග වන විද්‍යුත් තැපැල් ලිපිනය,Whatsapp අංකය හා දුරකතන අංක බඳවාගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

7.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරිය ලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය.

7.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

7.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කලහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.9 තරඟ විභාගයේ දී සිසුන් ලබාගත් ලකුණු දිස්ත්‍රික්ක මට්ටමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ.එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැලකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් දිස්ත්‍රික්ක පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී අධ්‍යාපනික හා අදාල අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කර ගන්නා බවට තහවුරු කිරීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමවේදය* :

8.1 අදාළ වර්ෂය තුළ දී සියළුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පදනම්කර ගෙන එක් එක් දිස්ත්‍රික්කවලින් ඇතුලත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කරනු ලැබේ.

8.2 දිස්ත්‍රික් පදනම සලකා බැලීමේ දී අ.පො.ස. (සා.පෙ) විභාගයට පළමුවර පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ.

8.3 අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාල වල ඇති පුහුණු පහසුකම් පාදක කරගනිමිනි.එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරඟ විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයේ පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

8.4 කෘෂිකර්ම විද්‍යාලවලට උපරිම සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමේ අරමුණින් කිසියම් දිස්ත්‍රික්කයක තෝරාගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී අනිකුත් දිස්ත්‍රික්ක වලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව ඔවුන් ලබා ඇති තරඟ විභාග ලකුණු පදනම් කර ගනිමින් තෝරාග නු ලැබේ.

8.5 යම් අයදුම්කරුවෙක් පාඨමාලාවට බඳවාගැනීම සඳහා කරනු ලබන අනියම්/අයුතු බලපෑම් ඔහු/ඇය පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා නුසුදුස්සෙක් වීමට හේතුවේ.

8.6 පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයන්ට අනුයුක්ත කිරීමෙන් පසු ඔවුන්ට කෘෂිකර්ම විද්‍යාල අතර මාරු වීම් සිදු කල නොහැක.

8.7 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව හැර යන්නේ නම් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

8.8 බඳවාගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

8.9 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පලවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකුලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2024 අප්‍රේල් මස 25 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

05-66

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024 වර්ෂය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.04 දිනැතිව අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුරෙහි පවත්නා පුරප්පාඩු **03ක්** සම්පූර්ණ කිරීම සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම් :

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(*ආ*) රසායන විද්‍යා හා භෞතික විද්‍යා විෂයන් දෙක සහිතව භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් ව තිබීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළුව තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

1.2 *වෘත්තීය සුදුසුකම් :*

ක්ෂේත්‍රයට අදාළ වන්නාවූ පහත සඳහන් පාඨමාලා වලින් එක් පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම.

i. මොරටුව විශ්ව විද්‍යාලය හා අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

ii. කැලණිය විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ව්‍යවහාරික රසායන විද්‍යා එක් අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමාව සාර්ථකව නිම කර සහතික ලබා තිබීම. (Diploma in Applied Chemistry);

iii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

iv. NVQ 06 මට්ටමට සමාන වන හෝ ඊට ඉහළ මට්ටමක පවතින ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.

1.3 *පළපුරුද්ද :* අදාළ නොවේ.

1.4 *කායික සුදුසුකම් :*

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය

1.5 *වෙනත් සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

iv. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

1.6 *වයස :*

අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

උපරිම සීමාව : අවුරුදු 30ට නොවැඩි

02. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 03කි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්

පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

03. **සේවා කොන්දේසි :**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/04/2017 හා 2018.01.04 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කරන සංශෝධන වලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 දරන හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත් වේ.

3.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3.3 තමන් වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

04. **මාසික වැටුප් පරිමාණය :**

2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 31,040- 10x455 - 11x660-10x730-10x750- රු. 57,550 (MT 03 -2016) වේ.

එනම් රු. 31,040 ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවනු ලැබේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

5.1 **ලිඛිත විභාගය :**

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

5.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.
5.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

6. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නමට මහජන බැංකුවේ ගිණුම් අංක : 176100129027313 දරන ගිණුමට බැර වන ලෙස ගෙවා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

i. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.
ii. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

07. **අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින් ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ. විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත (ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) **2024.06.10** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
තැ. පෙ. 355, ඕල්කොට් මාවත
කොළඹ 10

(ඇ) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීමේ තරග විභාගය - 2024'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. **විභාගයට ඇතුළුවීම :**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ මුල පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති උල්ලංඝණය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට /ඇයට සිදුවනු ඇත.

(ඇ) **අත්සන සහතික කිරීම :**

අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන් සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර ගත යුතු ය.

*සටහන* :- අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. **අයදුම්කරුගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ :

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

I. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ කවර හෝ අවස්ථාවක දී වුවද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුවද යටත් වේ.

11. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

11.1 විභාග මාධ්‍යය :

I. මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*සටහන* :

a. අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
b. තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

11.2 **විභාග ප්‍රතිඵල :**

I. මෙම විභාගයේ ප්‍රතිඵල ලිඛිත විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ http://www.railway.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ කටයුතු කරනු ඇත.

II. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

11.3 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, සිද්ධි විශ්ලේෂණය කිරීමේ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | යන්ත්‍ර සූත්‍ර හා උපාංගවල අඩංගු ලෝහ වර්ගවල සංයුතිය සම්බන්ධ ගුණාත්මක හා ප්‍රමාණාත්මක විශ්ලේෂණයන් පිළිබඳ දැනුම සහ Destructive සහ non destructive පරීක්ෂණ, රසායනික හා භෞතික පරීක්ෂණ හා විද්‍යාත්මක මූලධර්ම මත පදනම් වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

13. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී.

දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඔල්කොට් මාවත,
කොළඹ 10.

2024 අප්‍රේල් මස 08 වැනි දින.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය<br>සිංහල - 2<br>දෙමළ - 3<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐ |
| පුරවැසිභාවය<br>පරම්පරාවෙන් - 1 ☐<br>ලියාපදිංචිවීමෙන් - 2 ☐<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) |

☐

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර තනතුරේ - III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

Open competitive Examination for Recruitment to the post of Research Assistant, Grade III, in Sri Lanka Railway Department - 2024

01. සම්පූර්ණ නම :
   i. සිංහලෙන්/දෙමළෙන් :————.
   ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
   (උදා : HERATH MUDIYANSELAGE PIYAL SILVA)

02. ස්ථිර ලිපිනය :
i. සිංහලෙන්/දෙමළෙන් :————.
ii. ඉංග්‍රීසියෙන් :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී 1
පුරුෂ 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකථන අංකය :

06. ජන වර්ගය

සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3

මුස්ලිම් - 4/බර්ගර් - 5/මැලේ - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. පදිංචිය :
i. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————. එහි අංකය
ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
iii. දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය මාසය දිනය

2024 ...... දිනට වයස : අවු. : මාස : දින :

09. (අ) අධ්‍යාපන සුදුසුකම් :
i. අ.පො.ස. (සා.පෙළ)

විභාග අංකය :————. වර්ෂය :————.

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |
| v. | | |

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| vi. | | |
| vii. | | |
| viii. | | |
| ix. | | |

i. අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

විභාග අංකය :————. වර්ෂය :————.

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |

(ආ) ලබා ඇති වෘත්තීය සුදුසුකම් :

..............................................................................................................
..............................................................................................................

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුව තුළ " x " ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

11. **අයදුම්කරුගේ සහතිකය :**

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගුවන බව හා තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු ඉහත කරුණු අනාවරණය වුවහොත් තනතුර සඳහා කරන ලද පත්වීම අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දැන සිටිමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) .................. දින .................. තැපැල් කාර්යාලයට රු. 1000 ක් ගෙවා ලබාගත් අංක .................. දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| |
|---|
| ලදුපත එහි එක් දාරයකින් නොගැලවෙන සේ අලවන්න. |
| (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තවද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

05-68

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

### රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

### ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2024 වර්ෂය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leaves (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 25,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 45,000

---

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.25,000

